# මිල, වැටුප් හා සේවා නියුක්තිය

**මිල වෙනස්වීම්**

1985 වර්ෂයේදී මිල වැඩිවීමේ අනුපාතිකය සැලකිය යුතු ලෙස අඩුවිය. සිල්ලර මිල මඳ වශයෙන් ඉහළ ගිය අතර, අපනයන මිලෙහි පැවති අවනතිය නිසා නිෂ්පාදන මිල ගණන් සැලකිය යුතු පරිදි අඩුවිය. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය අනුව මැනීමේදී 1985 වර්ෂයේදී සාමාන්‍ය පාරිභෝගික මිල සියයට 1.5 කින් වැඩි විය. මෙය 1977 වර්ෂයට පසුව පැවති අඩුම වර්ධනයයි. තොග අලෙවි මිල දර්ශකය අනුව නිෂ්පාදන මිල ගණන් 1985 දී සියයට 15.2 කින් පහත වැටිණ.

1985 වර්ෂයේදී මිල වැඩිවීමේ අඩු අනුපාතිකයට විවිධ හේතූන් දයක විය. ආහාර භාණ්ඩ සැපයුම ඉහළයාම, පොල් සහ තේ සඳහා පැවති පහත් මිල, ආනයන මිලෙහි අඩු වර්ධනය, ඉන්ධන මිල වර්ෂය පුරාම ස්ථාවරව පැවතීම සහ නොකඩවා පවත්වා ගෙන ගිය දැඩි ණය සීමා ප්‍රතිපත්තීන් සහ 1984 වසරේ ක්‍රියාත්මක කළ ප්‍රසාරිත නොවූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්ගේ බලපෑම් මෙම වසරේ මිල වැඩිවීමේ අනුපාතිකය අඩුවීමට හේතු විය.

**පාරිභෝගික මිල**

කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව, පාරිභෝගික මිල, පසුගිය වර්ෂයේ වූ සියයට 17 ක වාර්ෂික වැඩිවීම සමඟ සැසඳීමේදී, 1985 වර්ෂයේ වැඩිවූයේ සියයට 1.5 කින් පමණි. 1984 වර්ෂයේදී සියයට 9.5 ක වැඩිවීම හා සැසඳීමේදී එම සමකාලය තුළදීත් (1984 දෙසැම්බර් වලට වඩා 1985 දෙසැම්බර්) දර්ශකය වැඩිවූයේ සියයට 1.5 කින් පමණි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය වර්ෂයේ පළමුවන සහ තෙවන කාර්තුව තුළදී පහත වැටුනද, දෙවන කාර්තුව තුළදී නොවෙනස්ව තිබී, අවසන් කාර්තුවේදී නැවත ඉහළයාමක් සිදුවිය. මෙම මිල හැසිරීම පසුගිය වර්ෂයේ මිල හැසිරීමට ප්‍රතිවිරුද්ධව සිදුවූවකි. එම වර්ෂයේ පළමුවන භාගයේදී තියුණු ලෙස මිල වැඩිවූ අතර, අවසාන කාර්තුවේදී මිල වැඩිවීමේ වේගය අඩුවිය.

ආහාර කාණ්ඩයේ ආන්තික වැඩිවීම සහ අනෙකුත් සියළුම කාණ්ඩවල සැලකිය යුතු අඩු වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අඩු වර්ධනයක් සිදුවිය. රෙදිපිළි සහ විවිධ කාණ්ඩ සඳහාද උපදර්ශකයන් සියයට 5.5 බැගින් වැඩිවූ අතර, ඉන්ධන සහ ආලෝකය සඳහා වූ උපදර්ශකය සියයට 3.9 කින් වැඩිවිය. 1984 දී අදාළ උපදර්ශක පිළිවෙලින් සියයට 5.6 කින්, සියයට 17.9 කින් සහ සියයට 14.6 කින් වැඩිවිය.

අධික නිෂ්පාදන සහ පහත් අපනයන මිල ගණන් නිසා පොල් සහ පොල්තෙල්වල දේශීය මිල පහත වැටුණි. වර්ෂය මුළුල්ලේම පොල් මිලෙහි ක්‍රමික අඩුවීම කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සැලකිය යුතු අඩුවීමට බලපාන ලදී. වාරික සැපයුම නිසා සහල් මිල ගණන් වර්ෂය තුළදී උච්චාවචනය වූ නමුත් පසුගිය වර්ෂයේ මිල ගණන් හා සැසඳීමේදී 1985 සාමාන්‍ය සහල් මිල වැඩිවූයේ මඳ වශයෙනි. එළවළු, මාළු සහ කුළුබඩු වැනි අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්ගේ මිල වර්ෂය තුළදී ආන්තික වශයෙන් ඉහළ නැඟුණි.

1984 වර්ෂයේ සියයට 61.9 කින් වැඩිවූ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි අපනයන ගණයේ උපදර්ශකය 1985 දී සියයට 31.8 කින් පහත වැටිණ. 1984 වර්ෂයේ සියයට 15.7 ක වැඩිවීම හා සැසඳීමේදී දේශීය ගණය සඳහා වූ උපදර්ශකය සියයට 6.8 කින් වැඩිවිය. 1984 දී සියයට 10.4 කින් වැඩිවූ ආනයන ගණය 1985 දී වැඩිවූයේ සියයට 3.2 කින් පමණි.


**තොග අලෙවි මිල**

පසුගිය වර්ෂ කීපය තුළදී තොග අලෙවි මිල දර්ශකයේ දක්නට ලැබුණු ඉහළ යාමේ ප්‍රවණතාවය 1985 වර්ෂයේදී ආපසු හැරී සියයට 15.2 කින් පහත වැටිණ. මෙය 1984 වර්ෂයේදී සියයට 26 ක වැඩිවීමට ප්‍රතිබද්ධිත වූවකි. සමකාලීන සැසඳීමේදී (1984 දෙසැම්බර් වලට

# තොග අලෙවි මිල දර්ශකය

1974=100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

වඩා 1985 දෙසැම්බර්) තොග අලෙවි මිළ දර්ශකයේ අඩුවීම සියයට 18.2 කි. 1984 වර්ෂයේ අපනයන භාණ්ඩවල විශේෂයෙන්ම තේ සහ පොල්වල සැළකිය යුතු ලෙස වැඩිවූ මිළ 1985 වර්ෂයේ මුල් අවධියේ සිට වර්ෂය පුරාම අඩුවෙමින් පැවතිණ. සමස්ත දර්ශකයේ තියුණු පහත වැටීමට මෙය ප්‍රධාන වශයෙන් හේතුවිය. 1984 වර්ෂයේ සියයට 51.2 ක වැඩිවීම හා සැසඳීමේදී 1985 වර්ෂයේදී අපනයන භාණ්ඩ සඳහා වූ උපදර්ශකය සියයට 38.8 කින් පහත වැටිණ. 1984 වර්ෂයේදී සියයට 6.3 ක් සහ සියයට 11.3 ක වැඩිවීම් හා සැසඳීමේදී 1985 ආනයන සහ දේශීය භාණ්ඩ සඳහා වූ උපදර්ශකයන් වැඩිවූයේ පිළිවෙලින් සියයට 3.1 කින් හා සියයට 7.3 කින් පමණි. කෙසේ වෙතත් අපනයන ගණයේ උපදර්ශකයේ අඩුවීම දේශීය හා ආනයන ගණවල උපදර්ශකයන්ගේ වැඩිවීම් මගින් තුලනය විය.

සමස්ත දර්ශකයේ සියයට 67.8 ක බරතැබුමක් ඇති ආහාර කාණ්ඩයේ උපදර්ශකය 1984 වර්ෂයේදී වූ සියයට 33 ක වැඩිවීම හා සැසඳීමේදී සියයට 24 කින් 1985 දී පහත වැටිණ. ආහාර උපදර්ශකයේ පහත වැටීම මගින් අනෙක් උපදර්ශකයන්ගේ වැඩිවීම් අභිබවා ගියේය.

1984 දී පාරිභෝගික භාණ්ඩ සඳහා වූ උපදර්ශකය සියයට 31.2 කින් වැඩිවීම හා සැසඳීමේදී, සියයට 20.5 කින් අඩුවිය. 1984 වර්ෂයේදී පිළිවෙලින් සියයට 10 ක හා සියයට 8 ක වැඩිවීම හා සැසඳීමේදී අන්තර් හා ආයෝජන භාණ්ඩ මිළ ගණන් සියයට 3 බැගින් වැඩිවිය.

වැටුප්

1985 දී සංවිධානය වූ අංශයේ වැටුප් වර්ධනයක් සිදුවූ අතර, සංවිධානය නොවූ අංශයේ වැටුප් බොහෝදුරට නොවෙනස්ව පැවතිණ. සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් අනුපාතයට වඩා වැඩි වේගයකින් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අවම වැටුප් ප්‍රමාණයන් වැඩිවුණි. ආර්ථිකයේ පැවති පහත් උද්ධමන වර්ධනය නිසා 1985 දී මූර්ත වැටුප් ප්‍රමාණයන් සැළකිය යුතු ලෙස ඉහළයාම මැත වර්ෂ කීපය තුළ ඇතිවූ අත්දැකීමට වඩා හාත්පසින්ම වෙනස්වූවකි.

1985 දී පාසැල් ගුරුවරුන්ගේ හැර, සෙසු රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක සියයට 15 කින් වැඩිවිය. 1985 ජනවාරි මාසයේ සිට ගෙවන ලද අතිරේක රුපියල් සියයේ (රු. 100) දීමනාව නිසා ජීවන වියදම් දීමනාව රු. 504 දක්වා වැඩිවීම මෙම වර්ධනයට හේතු විය. පසුගිය වසර වල මෙන් විධායක නොවන නිලධාරින්ගේ වැටුප් ප්‍රමාණයන් (සියයට 14.3) වැඩිවීම හා සැසඳීමේදී රාජ්‍ය අංශයේ සුළු සේවකයන්ගේ වැටුප් වැඩිවීම් ඉහළ මට්ටමක (සියයට 16.2) විය. 1983 දී සහ 1984 දී දක්නට ලැබුණු උපනතිය ආපසු හැරී 1985 දී මෙම අංශයේ මූර්ත වැටුප් සැළකිය යුතු ලෙස (සියයට 14.6) වර්ධනය විය.


ගුරු වැටුප් සමාලෝචන කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාසැල් ගුරුවරුන්ගේ වැටුප් දර්ශකය සියයට 17 කින් වැඩිවිය. මෙම ප්‍රතිශෝධනය සහතික ලත් සහ සහතික නොලත් ගුරුවරුන්ට අදළ නොවිය. මෙම ප්‍රතිශෝධනය යටතේ අවම මාසික වැඩිවීම රුපියල් 190 ක් විය. 1983 දී හා 1984 දී පිළිවෙලින් සියයට 4 ක හා සියයට 0.6 බැගින් පහත වැටී තිබුණු මූර්ත වැටුප් මට්ටම වැටුප් වැඩිවීමේ හා උද්ධමනයේ අඩු වර්ධනය හේතුකොටගෙන 1985 දී සියයට 15 කින් වැඩිවිය.

1984 දී සියයට 19 ක වර්ධනය හා සැසඳීමේදී පඩි පාලක සභා කර්මාන්තයන්ට අයත් සංවිධානය වූ පුද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණයන් 1985 දී ඉහළ නැඟුණේ සියයට 9 කිනි. 1984 රාජ්‍ය වැවිලි අංශයේ කරන ලද සේවක වැටුප් ප්‍රතිශෝධන නිසා 1985 දී රාජ්‍ය වැවිලි අංශයේ වැටුප් ප්‍රමාණයන් නොකඩවා ඉහළ නැඟුණි. 1984 දී වැවිලි අංශයේ වැටුප් සම්බන්ධ තීරණ ගැනීමේදී සංශෝධිත ප්‍රතිපත්තිය පඩි පාලක සභාවලට අයත් පුද්ගලික අංශයේ

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණ තීරණ කිරීම සඳහා පමණක් සීමාවුණි. ඒ හේතුව නිසා වැටුප් තීරණය කිරීමේ ද්විත්ව ක්‍රමයක් දූන් ක්‍රියාත්මක වේ. ඉන් එකක් රාජ්‍ය සංස්ථා වලටද අනෙක පුද්ගලික වතුවලටද වශයෙනි. මේ හේතුව නිසා රාජ්‍ය වැවිලි අංශයේ වැඩි වැටුප් පුද්ගලික වතුවල වැටුප් සඳහා බලපෑ නමුත් ඒ අනුවම එම වැටුප් තීරණය නොවීය.

### 1 . 24 සංඛ්‍යා සටහන
### සංවිධානය වූ අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක
### 1978 දෙසැම්බර් = 100

| සංවිධානයවූ අංශය | | වැටුප් ප්‍රමාණ දර්ශක | | ඒකක වෙනස | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| | | 1984 | 1985 | | |
| 1. පඩිපාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවන් | .. | 224·3 | 244·1 | 19·8 | 8·8 |
| i කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන් | .. | 250·2 | 273·5 | 23·3 | 9·3 |
| ii කර්මාන්තවල හා වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන් | .. | 168·3 | 192·5 | 24·2 | 14·4 |
| iii සේවා අංශයේ කම්කරුවන් | .. | 179·7 | 179·7 | — | — |
| 2. සියළුම රජයේ සේවකයන් | .. | 246·6 | 284·3 | 37·7 | 15·3 |
| i සියළුම විධායක නොවන නිලධාරින් | .. | 231·4 | 264·4 | 33·0 | 14·3 |
| ii සියළුම සුළු සේවකයන් | .. | 260·9 | 303·2 | 42·3 | 16·2 |
| 3. රජයේ පාසැල් ගුරුවරුන් | .. | 211·4 | 247·3 | 35·9 | 17·0 |

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1985 වර්ෂයේදී සංවිධානය වූ පුද්ගලික අංශයේ කර්මාන්ත හා වාණිජ කටයුතුවල නිරත කම්කරුවන් සඳහා (සියයට 14) ඉහළම වැටුප් වැඩිවීම ලැබුණි. 1984 දී මෙම අංශය සඳහා වැටුප් වැඩිවූයේ සියයට 3 කින් පමණි. 1984 දී සියයට 26 ක්වූ ඉහළ වැඩිවීම හා සැසඳීමේදී කෘෂිකාර්මික අංශය සඳහා වැටුප් වැඩිවූයේ සියයට 9 කිනි. සේවා අංශයේ නියුතු කම්කරුවන් සඳහා වැටුප් ප්‍රමාණයන් නොවෙනස්ව පැවතිණ.

### 1 . 25 සංඛ්‍යා සටහන
### අවම සහ මූර්ත වැටුප් ප්‍රමාණයන්හි වෙනස්වීම් 1982—1985

| වර්ෂය | පඩිපාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවන් | | සියළුම රජයේ සේවකයන් (අ) | | පාසැල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය වෙනස % | මූර්ත වෙනස % | මූල්‍ය වෙනස % | මූර්ත වෙනස % | මූල්‍ය වෙනස % | මූර්ත වෙනස % |
| 1982 | 16 | 4 | 29 | 16 | 25 | 13 |
| 1983 | 7 | – 6 | 15 | 9 | 13 | – 0·6 |
| 1984 | 19 | 2 | 14 | – 2 | 12 | – 4 |
| 1985 | 9 | 7 | 15 | 14 | 17 | 15 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පාසැල් ගුරුවරුන් හැර.

සේවා නියුක්තිය

1985 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වර්ධනය වූ අතර අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය පහත වැටී ඇත. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ දත්තයන් නොමැති නිසා පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ වර්ධනය මැනීම අපහසු වී ඇත. කෙසේ වුවත් සංවිධානය වූ සහ සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය මෑත වර්ෂවල දී සමහරවිට අඩු අනුපාතයකින් වුවද වර්ධනය වූ බවට සාධක ඇත.

තාවකාලික ඇස්තමේන්තු අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1984 වර්ෂයේ දී සියයට 1.2 ක වැඩි වීම හා සසඳන කල 1985 වර්ෂයේදී පුද්ගලයින් 7,597 කින් හෝ සියයට 1.5 කින් වැඩි වී ඇත. සේවා නියුක්තියේ සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබෙන්නේ පහත දැක්වෙන අංශයන්හිය. එනම් අධ්‍යාපන, කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන, සෞඛ්‍ය, වාරිමාර්ග, විගණන කටයුතු, දිස්ත්‍රික් පරිපාලනය, කම්කරු සහ බන්ධනාගාර සේවාවන්හිය. එහෙත් ඉඩම් නිරවුල් කිරීම, යන්ත්‍රෝපකරණ සහ මහාමාර්ග සංවර්ධන සේවාවන්හි සේවා නියුක්තියේ සැළකිය යුතු පහත වැටීමක් දක්නට ඇත.

අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තියෙහි පහත වැටීමේ නැමියාව 1985 වර්ෂයේදීද පැවතිණ. එනම්, 1984 වර්ෂයේ සියයට 2.6 ක අඩු වීම හා සසඳන කළ 1985 වර්ෂයේ සියයට 2.4 ක අඩු වීමක් දක්නට ලැබිණ. මෙයට ප්‍රධාන හේතු වශයෙන්, වැවිලි අංශයේ ශ්‍රම බලකාය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය වැවිලි අංශයේ අනියම් සේවකයින් ඉවත් කිරීම සහ ගංගා නිම්න සංවර්ධනය, ලෝහ භාණ්ඩ නිෂ්පාදනය, සිමෙන්ති නිෂ්පාදනය, කඩදාසි නිෂ්පාදන, යකඩ සහ වානේ නිෂ්පාදනය සහ පොදු පහසුකම් සැපයීම වැනි කාර්යයන් හා සම්බන්ධ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය අඩු වීම සඳහන් කළ හැකිය. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස ඛනිජ තෙල් නිෂ්පාදනය, ගොඩනැගිලි ද්‍රව්‍ය, ටයර් සහ ටියුබ්, රෙදිපිළි, නිවාස සංවර්ධනය සහ ප්‍රවාහනය හා සම්බන්ධිත ආයතනයන්හි සේවා නියුක්තිය සැළකිය යුතු ලෙස වැඩි වී ඇත.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික පදනමක් මත සකස් කළ දත්තයන් නොමැතිවීම සහ සේවක අර්ථ සාධක අරමුදලේ දත්තයන් මත පදනම් වූ සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ 1985 වර්ෂය සඳහා අවසාන ඇස්තමේන්තු නොමැති නිසා පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ නැමියාවන් තක්සේරු කිරීම සඳහා අනෙකුත් දර්ශකයන් උපයෝගී කර ගැනීමට සිදු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද සීමිත පොදු හා පෞද්ගලික සමාගම්වල සැලසුම් කළ ආයෝජන පිළිබඳ සමීක්ෂණයේ තොරතුරු අනුව 1984/85 දී මෙම සමාගම්වල සේවා නියුක්තිය එයට පෙර වර්ෂයට වඩා සියයට 8.6 කින් වැඩි වී ඇත. 1985/86 වර්ෂයේදී එම සමාගම්වල සේවා නියුක්තිය සියයට 10.8 ක වැඩි වීමත් බලාපොරොත්තු වන බව එම තොරතුරු අනුව තවදුරටත් හෙළි වෙයි.

1984 අවසානය දක්වා රැකියා සපයා ඇති පුද්ගලයින් 29,477 හා සසඳන කළ මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් මගින් 1985 වර්ෂයේ අවසානය දක්වා පුද්ගලයින් 32,329 කට රැකියා සපයා ඇත. විදේශ ආයෝජන උපදේශක කමිටුව හා දේශීය ආයෝජන උපදේශක කමිටුව අනුමත කළ ව්‍යාපෘතීන්හි 1985 වර්ෂය තුළ පිළිවෙලින් පුද්ගලයින් 4,250 කට සහ 12,850 කට රැකියා සැපයීමේ හැකියාවක් තිබුණු බව පෙනේ. එම වර්ෂයේ අවසාන භාගයේදී සංචාරකයින් පැමිණීම සුළු වශයෙන් ඉහළයාම සේවා අංශයේ රැකියාවන් වැඩි වීමට උදව් වූ අතර, ප්‍රවාහනය හා ආනයන අපනයන වෙළඳාමේ වර්ධනය එකී අංශයන්හි රැකියාවන් වැඩි වීම තවදුරටත් පැවතීමට ආධාර විය.